# හින්දු ආගමේ 'කර්ම සංකල්පය' පිළිබඳ අධ්‍යයනයක්

*සීලවිමල, පූජ්‍ය හසලක* [1]

භාරතීය දාර්ශනික ඉතිහාසයේ ප්‍රකට ඉගැන්වීමක් ලෙස කර්ම සංකල්පය හඳුනාගත හැකිය. හින්දු ඉගැන්වීමට අනුව කර්මය ජීවීන් කෙරෙහි බෙහෙවින් බලපාන අතර, ජීවිතය අර්ථවත් කරන ශක්ති විශේෂයක්ද වේ. කර්ම සංකල්පයේ බීජ අවස්ථාව ඍග් වේදයට අනුව '**ඍත**' යනුවෙන් හඳුන්වයි. කර්මයෙහි යහපත්-අයහපත් බව වරුණ දෙවියන්ගේ ප්‍රසාදයට හා අප්‍රසාදයට හේතු වන බවත්, '**වරුණ ඍත**' සංකල්පයෙන් ඉන්දියානු කර්ම සංකල්පය බිහි වූ බව විද්වත් මතයයි. පුද්ගලයා තුළ හටගන්නා කාමය වැනි මනෝභාවයන් කර්මය විෂයෙහි මූලික වන බව චාන්දෝග්‍ය උපනිෂදය නිදර්ශනාත්මකව දක්වා තිබේ. කර්ම විෂය කුල භේදය සමඟ ගළපන්නට ගත් උත්සාහයද උපනිෂද් ග්‍රන්ථවලදී හඳුනාගත හැකිය. යහපත් කර්ම කරන්නා මරණින් මතු බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය කුලවල උපදින බවත්, ඊට ප්‍රතිවිරුද්ධ කර්ම කරන්නා සුනඛ, ඌරු වැනි ජාතීන්හි මෙන්ම චණ්ඩාල වැනි ප්‍රාථමික කුලයන්හි උපදින බවත් '**චාන්දෝග්‍ය උපනිෂද්**' ග්‍රන්ථයෙහි දැක්වේ. පසුකාලීන හින්දු දාර්ශනික ග්‍රන්ථයක් වන '**පූර්ව මීමංසාව**'ට අනුව කර්මය සය විධ වශයෙන් ප්‍රභේද කොට දක්වයි. කාර්යතාඥාන, කෘතිසාධ්‍යතාඥාන, චිකිර්ෂා, කෘති, චෙෂ්ටා, ක්‍රියා යනුවෙන් කර්මයට සාධකයන් දක්වන අතර, ප්‍රතිලාභ අපේක්ෂාන්විතව කර්ම කිරීම ස්වර්ගයට මාර්ගය බවත්, අපේක්ෂා රහිත බව මෝක්ෂයට මාර්ගය බවත් පූර්ව මීමංසාව දක්වයි. යෝගාචාර හින්දු දර්ශනයට අනුව කර්මයෙහි ප්‍රධාන බෙදීම් දෙකකි. පුණ්‍ය-පාප යන භාවිතය ශුක්ල-ක්‍රිෂ්ණ වශයෙන් දැක්වේ. වෛශේෂික හින්දු දර්ශනයට අනුව කර්මය චේතනා විෂයෙහි නොව විශ්වයේ ස්වතන්ත්‍ර ධාතුවකි. එය ද්‍රව්‍යයක් හෝ ගුණයක් නොවන අතර ද්‍රව්‍යයන්හි, ගුණයන්හි අංගයක් ලෙස ක්‍රියා කරයි. මෙය සංයෝග-වියෝග ක්‍රියාවන්හි වැදගත් සාධකයකි. ප්‍රකට හින්දු ග්‍රන්ථයක් වන '**භගවත් ගීතා**'ව කර්මය පිළිබඳ වැදගත් කරුණු රාශියක් දක්වයි. හින්දු ආගමික දාර්ශනික ඉගැන්වීම් විෂයෙහි කර්ම සංකල්පය පිළිබඳ මූලාශ්‍රයාගත විවරණයන් මෙහිදී අවධානයට යොමු වේ.

**ප්‍රමුඛ පද :** ක්‍රියාව, චේතනා, හින්දු දර්ශනය, චින්තනය

[1]*ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.*